# ශ්‍රී ලංකාවට චීනයේ ෂියැන් සහෝදර නගර වැඩසටහනක්



පාත්ෆයින්ඩර් ආයතනයේ ආරාධනාවක් අනුව චීනයේ ෂියැන් මහ නගර සභාවේ ජ්‍යෙෂ්ඨ නියෝජිත කණ්ඩායමක් පසුගියදා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. කොළඹ හෝ මහනුවර මහ නගර සභා අතුරින් තෝරාගත් නගරයක් සමඟ සහෝදර නගර වැඩසටහනක් යටතේ සංවර්ධනය කිරීමේ ශක්‍යතාව ගවේෂණය කිරීම මෙම සංචාරයේ අරමුණ විය. මෙම මහ නගර සභා දෙකින් එකක් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙනදෙන වැඩසටහනක් සඳහා තෝරාගැනීමට පවතින හැකියාව මෙහිදී සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ නියෝජිතයන් සමඟ මෙම නියෝජිතයන් සාකච්ඡා කරන ලදී.

චීන ෂියැන් නගරයේ විදේශ කටයුතු කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වැන්ග් ෂියාඕෂෙන්, මූල්‍ය කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කොන් හොන්, විගණක කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මා ෂයොමින් සහ විදේශ කටයුතු කාර්යාලයේ කුවාන් ඩි යන මහත්වරු මෙම නියෝජිත කණ්ඩායමට ඇතුළත් වූහ.

ෂියැන් දූත පිරිස පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා හමුවූ අවස්ථාව ඡායාරූපයේ දැක්වෙයි. ඉපැරණි සේද මාවතේ මධ්‍යස්ථානය වූ ෂියැන් නගරය රතු මැටියෙන් තනන ලද ඓතිහාසික යුද භටයින්ගේ මූර්ති හේතුවෙන් ලෝක පූජිත අතර එම මූර්ති නැරඹීම පිණිස වාර්ෂිකව මිලියන ගණනක් සංචාරකයෝ එහි ඇදී එති. සහෝදර නගර සබඳතා අනුව ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමක් ඇති නගරයක් සම්බන්ධ කරගෙන ආර්ථික සහ සංචාරක සහයෝගීතා පුළුල් කිරීම අරමුණ බව මෙම සාකච්ඡාවේදී නියෝජිතයෝ සඳහන් කළහ.ආර්ථික පර්යේෂණ සම්බන්ධයෙන් දේශීය ආයතනයක් වන පාත්ෆයින්ඩර් පදනම ලෝකයේ වෙනත් රටවල එවන් ආකාරයේම ආයතන සමඟ සම්බන්ධතා වර්ධනය කරගැනීම තුළින් ජාත්‍යන්තර සහයෝගිතාවය කරා යොමු වෙමින් සිටින අතර දැනටමත් ඉන්දියාව, චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය සහ නෝර්වේ රටවල බුද්ධිමණ්ඩල සමඟ සබඳතා නිර්මාණය කරගෙන ඇත. එම රටවල සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඍජු සබඳතා ඇති වීමට, සංස්කෘතික සහ අධ්‍යාපනික වැඩසටහන් හුවමාරු කරගැනීමට මෙන්ම අන්‍යෝන්‍ය වාසි ලඟා කරන ව්‍යාපාර ප්‍රවර්ධනයට ද එය මග පාදයි.